# අධ්‍යාපන අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන්

## සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018(1)

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2018 මැයි මස කොළඹ දී පැවැත්වේ.

02. මෙම විභාගයට අදාල විෂය නිර්දේශය හා අනිකුත් විධිවිධාන අංක 1925/37, 2015 ජූලි මස 28 වන දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ *ගැසට් පත්‍රයේ* පළ කර ඇත. පහසුව සඳහා එම විෂය නිර්දේශය හා අනිකුත් විධිවිධාන පහත දක්වා ඇත.

නිලධාරියෙකුට මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට නියමිත විෂයයන් සඳහා එකම වතාවකදී හෝ වෙන වෙනම අවස්ථාවලදී හෝ පෙනී සිටිය හැක.

(අ) විභාග පටිපාටිය - කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂයන් පහත දැක්වේ :-

(i) විෂය අංකය 01 - සාමාන්‍ය කළමනාකරණය හා ආයතන කටයුතු
ලකුණු 100 - කාලය පැය 1 1/2

(ii) විෂය අංක 02 - මුදල් රෙගුලාසි
ලකුණු 100 - කාලය පැය 1 1/2

(iii) විෂය අංකය 03 - අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා අධ්‍යාපන නීතිය
ලකුණු 100 - කාලය පැය 02

(iv) විෂය අංකය 04 - ඉංග්‍රීසි භාෂාව
ලකුණු 100 - කාලය පැය, 02

*විෂයය නිර්දේශය*

(i) සාමාන්‍ය කළමනාකරණය හා ආයතන කටයුතු :
රජයේ ආයතන සංග්‍රහයේ **i, ii, iii iv, v, vii, viii, ix, xii, xiii, xiv, xxiv, xxviii, xxx** සහ **xxxi** යන පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති **i, iii, iv, v, vi, viii, x** හා **xii** යන පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව

(ii) මුදල් රෙගුලාසි :
රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ I වැනි කොටසේ i, ii, v, viii, xii හා xiv පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව

(iii) අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා අධ්‍යාපන නීතිය :
අපේක්ෂකයින්ගේ පහත සඳහන් ආඥාපනත් හා පාර්ලිමේන්තු පනත් පිළිබඳව දැනුමක් අපේක්ෂා කෙරේ

(i) 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ (අධ්‍යාපනයේ නව මග)
(ii) 1981 අධ්‍යාපන ධවල පත්‍රිකාව
(iii) 1992 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පළමු වන වාර්තාව
(iv) 1997 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය,
(v) 1999 සිට ක්‍රියාත්මක වූ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ (ප්‍රාථමික ද්විතීයික හා අ.පො.ස. (උ. පෙළ),
(vi) 1976 අංක 15 දරන ප්‍රසිද්ධ විභාග (සංශෝධන) පනතින් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත
(vii) 1986 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනත
(viii) 1986 අංක 30 දරන අධ්‍යාපනික විද්‍යායතන පනත
(ix) 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත
(x) 1997 අංක 32 දරන ජාතික ගුරු අධ්‍යාපන අධිකාර්ය පනත
(xi) 13 වන සංශෝධනයට හා මූලික අයිතිවාසිකම් පිළිබඳ 3 වැනි පරිච්ඡේදයට විශේෂ අවධානය ඇතිව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
(xii) අධ්‍යාපනයට අදාල පළාත් සභා විසින් පනවා ඇති ප්‍රඥප්ති.

(iv) English Language

This is to assess the English language competence of the following subject areas :

- English Grammar - Tense and Number, Sentences (Simple/Compound/Complex/ Compound Complex), Relative Clauses, Adjectives and Adverbs, Prepositions

- Listening and Speaking Skills - General Greeting and Introductions, Giving and getting information, Advising, Suggesting and Expressing Opinions, Telephone Skills interviewing Skills, Meetings.

- Writing Skills - Internal modes of communication, Ecrmal Correspondence Skills, writing Descriptions/ Explanations, Summery writing skills report writing skills.

සැ.යු:- අපේක්ෂකයින් විසින් කාර්යක්ෂමතා පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා යටත් පිරිසෙයින් ලකුණු 40% ක ප්‍රමාණයක් ලබා ගත යුතුය. අපේක්ෂකයෙකුට එක් අවස්ථාවකදී එක් විෂයකට හෝ ඊට වැඩි සංඛ්‍යාවකට පෙනී සිට සමත්විය හැකිය.

*උපාධිය*, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ පශ්චාත් උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා ඇති විට මෙම කාර්යක්ෂමතා කඩඉම යටතේ ඇති ඉංග්‍රීසි විෂයය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

03. විභාගයේ භාෂා මාධ්‍යය

(i) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ii) තරග විභාගයක් මගින් රාජ්‍ය සේවයට ඇතුළු වූ අපේක්ෂකයෙකු නම් මෙම විභාගයේ භාෂා මාධ්‍යය ලෙස තරග විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය ද, තරග විභාග යක් නොමැතිව රාජ්‍ය සේවයට ඇතුළු වූ අපේක්ෂකයෙකු නම් මම විභාගයේ භාෂා මාධ්‍යය ලෙස රජයේ සේවයට ඇතුළු වීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය ද තෝරා ගත යුතුය.

04. අපේක්ෂකයෙකු තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් හෙළිවුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

05. ''ඉල්ලුම්පත්‍රය මෙහි දැක්වෙන ආකෘති පත්‍රයට අනුව ඒ 4 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් ශීර්ෂ අංක 01 සිට 05 තෙක් ශීර්ෂ පළමු පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස සකසා ඉදිරිපත් කළ යුතුය.''ඉල්ලුම්පත්‍රය පිළියෙල කිරීමේ දී එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතු ය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින් අයදුම්පත්‍රය යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට නිවැරදිව සම්පූර්ණ කර තිබේ ද යන්න පිළිබඳවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුළත්කොට ලදුපත අමුණා ඇත්ද යන්න පිළිබඳවත් විමසිලිමත් විය යුතුය. **ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.**

06. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී පවත්වනු ලබන අතර විභාගය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති.

*සටහන* : ව්‍යාජ තොරතුරු සැපයීම සඳහා දඬුවම් - ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකෙයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

07. ඉල්ලුම්පත්‍ර 2018 වර්ෂයේ මාර්තු මස 16 වන දින හෝ ඊට පෙර **''විභාග කොමසාරිස් ජනරාල් සංවිධාන හා විදේශ විභාග**

ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැපැල් පෙට්ටිය 1503, කොළඹ'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව එවනු ලබන කවර හෝ ඉල්ලුම්පත්‍රයක් වුවද ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ'' **ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය** - 2018 (I)'' යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

08. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාල ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන් විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් තම ප්‍රවේශපත්‍රය නොලැබුණිනම් දන්වීමේ සඳහන් ආකාරයට ඒ බව විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා විභාග ගාස්තු ගෙවූයේ නම් එම මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත ද, අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද ඔබගේ ඉල්ලීම් ලිපිය ද ෆැක්ස් මගින් යොමු කොට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

09. ඉහත 08 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන පැමිණිලි සළකා බලනු නොලැබේ.

10. අයදුම්පත්‍රයේ ද, විභාග සඳහා වන ප්‍රවේශපත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කරවා ගත යුතුය. ''විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන කිසිම අයදුම්කරුවෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.''

11. විභාග ශාලාවේදී තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා සුදුසු හැඳුනුම්පතක් ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වන අතර ඒ සඳහා පහත සඳහන් ලියවිලි අතරින් කුමක් වුවත් වලංගු වේ :

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

12. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

13. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු ගෙවිය යුතුය :

(i) පළමු වතාවට විභාගයට පෙනී සිටින අයගෙන් සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.
(ii) විභාගයට පෙනී සිටින්නේ පළමු වතාවට නොවන විට පහත සඳහන් පරිදි විභාග ගාස්තු අය කෙරේ.

| | |
|---|---|
| සම්පූර්ණ විභාගය සඳහා ගාස්තුව | රු. 500 කි |
| එක් විෂයයකට | රු. 250 කි |

විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල් ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත එහි එක් දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැළවෙන ලෙස ඇලවිය යුතුය. තව ද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ. විභාග ගාස්තුව සඳහා මුදල් ඇනවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් කරනු නොලැබේ. මෙම විභාග ගාස්තුවලට අමතරව කිසිදු අයකිරීමක් සිදු නොකරන බවද කාරුණිකව දන්වමි.

14. විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ලේඛනයක් ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් ලබා දෙනු ඇත.

15. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

**16. සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතීනම්, එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සළකා කටයුතු කරනු ලැබේ.**

17. මෙම විභාග නිවේදනය මගින් විධිවිධාන සළසා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

සුනිල් හෙට්ටිආරච්චි,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2018 පෙබරවාරි මස 05 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

## ඉල්ලුම්පත්‍රය

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017(11)
Efficiency Bar Examination for the Officers in Grade III of Sri Lanka Teacher Educators' Service - 2017 (11)

ඉල්ලුම්පත්‍ර ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැපැල් පෙට්ටිය 1503, කොළඹ'' යන ලිපිනයට ආයතන ප්‍රධානියා මගින් ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. (විභාගයේ නම, කවරයේ වමත් පස ඉහළ කෙළවරේ දැක්විය යුතුය).

නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :- සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
(ii) අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : GUNAWARDHANA, H. M. S. K.)
(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. (i) සේවය කරන විද්‍යාපීඨය/ගුරු විද්‍යාලය/ගුරු මධ්‍යස්ථානය හා ලිපිනය: (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ප්‍රවේශපත්‍ර මෙම ලිපිනයට එවනු ලැබේ.) :————.

(ii) පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(iii) ජංගම දුරකතන අංකය :————.

03. (i) ජාතික හැඳුනුම්පත් අංකය :

(ii) ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. නිවේදනයේ දෙවන ඡේදයේ (අ) යටතේ දක්වා ඇති විෂය අංකය හා විෂය සහිතව ගන්නා විෂයයන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

| *විෂයය අංකය* | *විෂයයේ නම* |
|---|---|
| | |
| | |
| | |
| | |

05. (i) උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

(ii) පදවි නාමය :————.

06. මීට ප්‍රථම මෙම විභාගයට සම්පූර්ණ ලෙස හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටියේද එසේ නම් එම විෂයයන් හා පෙනී සිටි වර්ෂය හා මාධ්‍යය සඳහන් කරන්න :

| විෂයය | වර්ෂය | මාධ්‍යය | විභාග අංකය |
|---|---|---|---|
| | | | |
| | | | |

07. විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ තොරතුරු :
 (i) ලදුපත් අංකය :————.
 (ii) ගෙවන ලද තැපැල්/උප තැපැල් කාර්යාලය :————.
 (iii) දිනය :————.
 (v) ගෙවූ මුදල :————.

ලදුපත එහි එක් දාරයක් මගින් මෙහි අලවන්න.

08. ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත් *ගැසට් නිවේදනයේ* 03 වන ඡේදයට අනුව දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

විභාග කොමසාරිස් ජනරාල්,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

ඉහත විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, *ගැසට් නිවේදනයේ* 03 වැනි ඡේදයට අනුව ඔහු/ඇය දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත්, මම සහතික කරමි. අපේක්ෂකයා/අපේක්ෂිකාව විභාග ගාස්තුවෙන් නිදහස් බවද/නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
පීඨාධිපතිගේ/ගුරු විදුහල්පතිගේ/මධ්‍යස්ථානාධිපතිගේ අත්සන හා පදවි නාමය,
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)
(අදාළ නොවන වචන කපාහරින්න.)

02-654